**තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය**

# ජාතික යොවුන් සේනාංකය

# ඇබෑර්තු

ජාතික යොවුන් සේනාංකයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

ස්ථිර පදනම මත බඳවා ගනු ලබන තනතුරු

01. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) (MM 1-1)
02. ප්‍රසම්පාදන නිලධාරී (JM 1-1)
03. ගිණුම් නිලධාරී (JM 1-1)

සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය හිමිය.

කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන තනතුරු

04. උපදේශක (සරඹ)

මෙම තනතුර සඳහා හුදෙක්ම බඳවා ගනු ලබන්නේ වසර 03 ක කොන්ත්‍රාත් පදනම මතය.

මෙම තනතුරු සඳහා අයදුම් කරනු ලබන සෑම අයදුම්කරුවෙකුම,

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

ආ. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

ඇ. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

## 01. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) (MM1-1)- ප්‍රධාන කාර්යාලය

**අධ්‍යාපන සුදුසුකම්** :- බාහිර අයදුම්කරුවන්

1. ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ), ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණය, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) විශේෂ, වාණිජවේදී (විශේෂ), විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණය (විශේෂ), ව්‍යාපාර කළමනාකරණවේදී (මානව සම්පත්) විශේෂ, ව්‍යාපාර පරිපාලනවේදී (මානව සම්පත් කළමනාකරණ)විශේෂ, විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණය) විශේෂ, නීතිවේදී, ශ්‍රම අධ්‍යාපනවේදී, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය), වාණිජවේදී (සාමාන්‍ය) යන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකක (02) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි අදාළ විෂය ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** :- අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

**වැටුප් කේත අංකය හා**
**මාසික වැටුප් පරිමාණය** :- MM 1-1-රු. 91,690 - 10X2,480-15X3,450 =168,240 මීට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලබයි.

කෙසේ වුවද, වර්ෂ 2027.01.01 දින තෙක් වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025හි II උප ලේඛනය පරිදි සිදු කරනු ලැබේ.

## 02. ප්‍රසම්පාදන නිලධාරී (JM 1-1)- ප්‍රධාන කාර්යාලය

**අධ්‍යාපන සුදුසුකම්** :- බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණ හෝ වාණිජවේදී උපාධියක් ලබා තිබීම.

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණසහකාර (තාක්ෂණික නොවන) (MA 1-1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** :- ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

**වැටුප් කේත අංකය හා**
**මාසික වැටුප් පරිමාණය** :- JM 1-1-රු. 72,650 - 10X1,360 - 18X2,040 = 122,970 මීට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලබයි.

කෙසේ වුවද, වර්ෂ 2027.01.01 දින තෙක් වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II උප ලේඛනය පරිදි සිදු කරනු ලැබේ.

## 03. ගිණුම් නිලධාරී (JM 1-1) - ප්‍රධාන කාර්යාලය

**අධ්‍යාපන සුදුසුකම්** :- බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වාණිජ, ගණකාධිකරණ, ව්‍යාපාර පරිපාලන, මූල්‍ය, ව්‍යාපාර කළමනාකරණ උපාධියක් ලබා තිබීම.
2. ගණකාධිකරණ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.
3. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව සමත්වීම (HNDA)

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (MA 1-1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ ගිණුම් ක්ෂේත්‍රයේ තනතුරක අවම වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** :- අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් කේත අංකය හා**
**මාසික වැටුප් පරිමාණය** :- JM 1-1-රු. 72,650 - 10X1,360 - 18X2,040 = 122,970 මීට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලබයි.

කෙසේ වුවද, වර්ෂ 2027.01.01 දින තෙක් වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II උප ලේඛනය පරිදි සිදු කරනු ලැබේ.

## 04. උපදේශක (සරඹ) - කොන්ත්‍රාත් පදනම

**සුදුසුකම් :-**

1. 8 වන ශ්‍රේණිය සමත් වී තිබීම
2. ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ, කොමිෂන් නොලත් නිලයකට නොඅඩු නිලයක් දරා තිබීම.
3. හමුදා සරඹ උපදේශක පාඨමාලාව සාර්ථකව හදාරා තිබීම හෝ යුද, ගුවන් හෝ නාවික හමුදාවක බටහිර තූර්ය වාදක කණ්ඩායමක සාමාජිකයකු වී තිබීම.

**වයස** :- වයස අවුරුදු 50 නොඉක්මවිය යුතුය.

**වැටුප් පියවර** :- කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව රු. 40,403/- ක මාසික දීමනාවක් 2025 වර්ෂයේදී හිමි වන අතර මෙම මාසික දීමනාව කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 හි උපලේඛන II අනුව 2027.01.01 දක්වා වසරින් වසර සංශෝධනය වේ. මීට අමතරව ජීවන වියදම් දීමනාවද හිමිවන අතර විශ්‍රාමිකයන් සඳහා හිමිවන්නේ ජීවන වියදම් දීමනාවෙන් විශ්‍රාම වැටුප සමග ලැබෙන ප්‍රමාණය හැර ඉතිරිය පමණි.

**විශේෂ සටහන**

1. **www.youthcorps.lk** වෙබ් අඩවියෙහි සඳහන් ආකෘති පත්‍රට අනුව සකස් කරනු ලැබූ අයදුම්පත ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ විමසුම් විස්තර සමග ඉදිරිපත් කළ යුතුය.
2. සම්පූර්ණ කරනු ලැබූ අයදුම්පත සමග උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික, සේවා සහතිකවල පිටපත් තමා විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.
3. එක් අපේක්ෂකයෙකුට තනතුරු කිහිපයකට අයදුම් කිරීමට අවශ්‍ය නම්, සෑම තනතුරක් සඳහාම වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුය.
4. ඉල්ලුම් කරන තනතුර අයදුම්පත බහාලූ කවරයේ වම්පස ඉහළ කෙලවරේ සඳහන් කළ යුතු අතර, අයදුම්පත් 2026.02.09 දිනට පෙර අධ්‍යක්ෂ, ජාතික යොවුන් සේනාංකය, අංක 420, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය.
5. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව ජාතික යොවුන් සේනාංකය වග කියනු නොලැබේ.
6. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව මෙම ආයතනයට ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ,**
**ජාතික යොවුන් සේනාංකය.**
**2026.01.26**